# ළමා අපයෝජනයට බලපාන සමාජමය හේතු සාධක.

(කළුතර මුහුදු වෙරළ පාර හා ඒ ආසන්න ප්‍රදේශය අලලා දියත් කරන ලද සමීක්ෂණය ඇසුරෙනි)

SOCI/R/016/98.

# නිබන්ධන සාරාංශය.

## හැදින්වීම.

පුද්ගල සමූහයක් ඒකරාශීව ජීවත්වීමේ දී එකිනෙකා අතර අන්‍යොන්‍ය පැවැත්මක් තිබිය යුතුවේ. මෙලෙස විධිමත් සම්බන්ධතා ජාලයක් පැවතිමට එම සමාජයන් විසින් සංස්කෘතිමය ලෙස සම්මත කරගන්නා වූ සමාජ අගනාකම්, ප්‍රතිමාන හා ධර්මය වැදගත් තැනක් ගනී. සෑම සමාජයකම සංස්කෘතික හරයන් වෙත සමාජීය වටිනාකමක් ලැබුණු අතර, එය සමාජයකින් සමාජයකට වෙනස් වේ. E.B - Tylor නම් සමාජ විද්‍යාඥයාට අනුව " සමාජයේ සාමාජිකයන් වශයෙන් මිනිසා විසින් අයත් කරගත් දැනුම, විශ්වාසය, කලා, නීතිය, චාරිත්‍ර - වාරිත්‍ර මෙන්ම මනුෂ්‍යයාගේ වෙනත් හැකියාවන්ගෙන් යුත් සමස්ථයකි." මේ නිර්වචනයට අනුව සෑම සමාජයක්ම සදාචාරය හා නීතිය වැදගත් කොට සලකයි. (Tylor - 1871. Pl. 1871)

" වයස අවුරුදු 5 ට අඩු මිලියන එකසිය පණහක් (මිලියන 150 ක්) පමණ වන දරුවන් දියුණු වෙමින් පවතින රටවල්හි අන්ත දිළිදුකම මැද ජීවත්වේ. පොහොසත් රටවල පවා දරුවන් මිලියන ගණනක් නොසලකා හැර අයුතු ආකාරයෙන් සැලකීම්වලට යටත්ව ඇති අතර, ලිංගික අතවරවලට ලක්වීම හෝ මත්ද්‍රව්‍ය භාවිතයට ගොදුරු වූවක් බවට පත්වී තිබෙනාවා

සමාජ සංස්ථා විසංවිධානය වීමත්, සමාජ චර්යාවේ සිදුවන නොයෙකුත් විපර්යාසයන් හමුවේ ළමා සුරක්ෂිතතාව ගිලිහී යාමෙන් ළමුන් අපයෝජන තත්ත්වයන්ට ලක්වන බව මින් පැහැදිලිවේ.

මෙම තත්ත්වය නිසාම ළමුන් වෙත තිබිය යුතු රැකවරණය විනාශවී හෝ ඔවුන් අවදානමට ලක්වීමේ තත්ත්වය වැඩිවෙමින් පවතී. ළමුන් නොගැලපෙන දේ සඳහා යොදා ගැනීම, ගෘහ සේවය, මෙහෙකාර සේවය, මත්ද්‍රව්‍ය, මත්පැන් වෙළඳාම ආදිය සඳහා යොදා ගැනීම ඇතුළු අයහපත් කාර්යයන්හි ළමුන් ඇද දැමීමේ ප්‍රවණතාවය ඉහළ යමින් පවතී. ඒ අනුව වර්තමාන සමාජය තුළ ළමා අපයෝජන තත්ත්වයන් දිනෙන් දින ඉහළ යමින් පවතින අතර, ළමුන් අවදානමට ලක්වීමද ඒ හා සමානවම ඉහළ අගයක් ගනී.

- **පර්යේෂණ මාතෘකාව**

" ළමා අපයෝජනයට බලපාන සමාජමය හේතු සාධක පිළිබඳ අධ්‍යයනය "

- **පර්යේෂණ ප්‍රදේශය.**

මෙම අධ්‍යනය සඳහා තෝරා ගනු ලැබුයේ කළුතර - උතුර මුහුදු වෙරළ පාර හා ඒ ආසන්න ප්‍රදේශයේ ජීවත්වන ප්‍රජාවයි. මුළු පවුල් සංඛ්‍යාව 249 ක් පමණ වන මෙහි මුළු ජනගහනය 1247 ක් පමණ වේ. අංක 717 ක් හා 718 ක් යන ග්‍රාම නිලධාරි වසම් මෙම අධ්‍යයන ප්‍රදේශය සඳහා තෝරාගනු ලැබූ අතර, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. නැගෙනහිරින්, කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයෙන්ද, බටහිරින් මුහුදින්ද, දකුණු දෙසින් කළු ගඟින්ද වටවූ මෙම ප්‍රදේශය කළුතර උතුර සීමාවේ පිහිටා ඇත. ක්ෂේත්‍රයට ළඟාවිය හැක්කේ කළුතර - උතුර පිරිවෙන හන්දියෙන් හැරී ශ්‍රී සුමංගල මාවතේ මීටර් 500 ක් පමණ පසු කිරීමෙන් පසුවයි. කළුතර සිට පැමිණෙන අයෙකුට කළුතර විශාල පාලම් දෙක පසු කරන විට කැලිඩෝ හන්දිය හමුවේ. එතැනින් ඉන්ද්‍රපාල අබේවීර මාවතේ මීටර් 100 ක් පමණ ඉදිරියට ගියවිට අදාළ ක්ෂේත්‍රය හමුවේ

- **පර්යේෂණ ගැටළුව.**

" ළමා අපයෝජනයට බලපාන සමාජමය හේතු සාධක" මෙම තත්ත්වය සත්‍ය වශයෙන්ම ශ්‍රී ලංකාවේ ගැටළුවක් ලෙස හිස එසවීම දැකිය හැකිය. සමාජ ස්ථරයේ විවිධ අංශයන්ට අහිතකර ලෙස බලපෑම් එල්ල කරමින් ළමුන් අවදානයට ලක්වීමේ ප්‍රවණතාවය දිනෙන් දින ඉහළ යමින් පවතී. ජාතික මට්ටමින් මෙතෙක් ඉදිරිපත්වී ඇති විවිධ වාර්තා විමර්ශනය කරනවිට කිසියම් අන්දමක ළමා අපයෝජන තත්ත්වයක් ශ්‍රී ලංකාවේ පවතින බව පිළිගැනීමට සිදුවෙයි. ළමයින් අපයෝජනයට ලක්වීම සෑම ජනවාර්ගික, ආගමික, අධ්‍යාපනික, සමාජයීය හා ආර්ථික ස්ථරයන්හිදීම දැකිය හැකිය. මීට අමතරව ධීවර ක්ෂේත්‍රය තුළ දිගු කාලයක් කටයුතු කිරීම මුල්කරගෙන මෙම ක්ෂේත්‍රයේදී අත්විදීමට ලැබුණු මෙම ප්‍රජාව මුහුණ දෙන විවිධ ප්‍රශ්න හා බැදී පවතින තත්ත්වයන් අවබෝධ කර ගැනීම තුළ පෞද්ගලිකවම මෙවැනි ගැටළුවක් අධ්‍යයනය කිරීමේ දැයි තත්ත්වයක් විසින් පොළඹවනු ලැබීම ද මෙම අධ්‍යයනයට බලපෑ හේතු ලෙස දැක්විය හැකිය.

- **උපන්‍යාසය ගොඩ නැංවීම.**

- දෙමාපියන්ගේ අඩු අධ්‍යාපන තත්ත්වය, අඩු ආදායම් තත්ත්වය හා අපයෝජනයන්ට යොමුවීම අතර සබැදියාවක් ඇත.

- මව/පියා දරුවන්ගෙන් ඈත්වීම හා අපයෝජනයට යොමුවීම අතර සබඳතාවයක් ඇත.

- අන්‍යයන් පාරිසරික තත්ත්වයන් හා අපයෝජනයට යොමු වීම අතර සබන්ධතාවයක් ඇත.

- පවුල තුළ අන්තර් සබඳතා හීනවීම හා අපයෝජනයට යොමු වීම අතර සබඳතාවයක් ඇත.

- නොගැලපෙන මිතුරු / මිතුරියන් ඇසුර, සම වයස් කණ්ඩායම්වල ඇසුර හා අපයෝජනයට යොමුවීම අතර සබඳතාවයක් ඇත.

## • පර්යේෂණ ක්‍රම වේදය.

මේ අරමුණු කරා ළඟා වීමට අවශ්‍ය දත්ත හා තොරතුරු සපයා ගැනීමේ අභිලාශයෙන් කළුතර මුහුදු වෙරළ පාරේ, පවුල් 249 න් 1/3 ක් අධ්‍යයනයට ලක්කර න ලද අතර, එම ප්‍රජාව තුළ සමීක්ෂණය දියත් කිරිම සඳහා පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරන ලදී. පර්යේෂණයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා පර්යේෂකයා විසින් විවිධ උපක්‍රම භාවිතා කරන ලදී. විශේෂයෙන් සංස්කෘතිය තුළ සැගවී, කථා නොකරන මාතෘකාවන් පිළිබඳ තොරතුරු ලබා ගැනිම ඉතාම දුෂ්කර කාර්යයක් වන අතර, මේ සඳහා විවිධ ක්‍රම උපයෝගී කරගත යුතුවේ. ප්‍රජාව යම් යම් කරුණු ගැන සාකච්ඡා කිරීමේදී තොරතුරු නොසපයන අවස්ථා එමටය.

පර්යේෂකයාගේ නිරීක්ෂණත්, අවිධිමත් සම්මුඛ සාකච්ඡාවලින් ලබා ගන්නා ලද දත්තත් මෙහිදි ඉතා වැදගත් වූ බව සඳහන් කළ හැකිය. පවුල 249 ක් වන මෙම ජනගහනයෙන් 1/3 ක් අහඹු ලෙස තෝරා ගන්නා ලදි. මීට අමතරව ලිංගික අපයෝජන තත්ත්වය ගැන තොරතුරු ලබා

ගැනීමට " සිද්ධි අධ්‍යයන " ක්‍රමවේදය භාවිත කළ අතර, මෙහිදී අරමුණු ගත නියැදියක් අධ්‍යයනයට ලක් කරන ලදී. මීට අමතරව ද්විතියික දත්ත උපයෝගී කර ගැනීම මගින් ගැටළුවේ ව්‍යාප්තිය හා සම්බන්ධ තොරතුරුත්, නීතිමය පක්ෂයන් ගැන සලකා බැලීම අවශ්‍ය වන හෙයින් පරිවාස නිලධාරී, පොලිස් ස්ථානය ඇතුළු රජයේ හා රාජ්‍ය නොවන ආයතනවලින් ද තොරතුරු රැස් කිරීම කරන ලද අතර, ස්වේච්ඡා සමිතිවල කාර්යයන්හි නියැලි පුද්ගලයන් ගෙන් ද, ප්‍රජාවේ ග්‍රාමීය නායකයන් ගෙන්ද අදාළ තොරතුරු ලබා ගැනීම කරන ලද අතර, විහාරස්ථානය, දේවස්ථානය ආදී ස්ථානවලදීද සම්බන්ධතා පවත්වමින් හැකිතාක් දුරට තොරතුරු එක්රැස් කර ගැනීමට උත්සාහ දරන ලදී.

- **පර්යේෂණ උපකරණ**

විසිමත් පරිදි සකසා භාවිතා කරන ලද පර්යේෂණ උපකරණය වූයේ සම්මුඛ සාකච්ඡා පත්‍රයයි. මීට අමතරව සිද්ධි අධ්‍යයන ( Case study) සඳහා එම ආයතන භාවිතා කරන ලද ආකෘතියම අනුගමනය කරමින් අදාළ තොරතුරු ලබා ගන්නා ලදී.